ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල - 2019
---------------------------------------------

**1.1** තාත්ත්වාගණනය කළ මතය
---------------------------

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 11 වගන්තිය සමඟ සංශෝධිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍යප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලිද ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි, වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත්කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.330,171ක් සමාලෝචිත වර්ෂයේ ආදායමට එකතුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඉදිරි වර්ෂවලදී පෙර වර්ෂ ගැලපීම් සිදුකිරීමට උපදෙස් දී ඇති බව. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම වැරදි නිවැරදි කර 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුවීම. |
| (ආ) | ප්‍රමිත 5 හි 31 ඡේදය ප්‍රකාරව, විදේශ මුදල් රුපියල්වලට පරිවර්තනය කිරීමේදී ඇතිවන ලාභය හෝ පාඩුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව විසින් හඳුනාගෙන තිබුණු රු.309,272 ක විදේශ මුදල් පරිවර්තනය කිරීමේ පාඩුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ජාතික අක්ෂි බැංකුව ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ අංශයක් හැටියට නොව ව්‍යාපෘතියක් හැටියට ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා වෙනම ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීමක් සිදු නොකරන බව. | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළ ජාතික අක්ෂි බැංකුවේ ගණුදෙනු හඳුනාගෙන ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම වරද නිවැරදි කර 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රමිත **7** හි **69** ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සුදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද සහ වත්කම හඳුනාගැනීමෙන් ඉවත් කළ පසු ක්ෂය කිරීම නවතා දැමිය යුතු වුවද, ඊට පටහැනිව වත්කම මිලදීගත් දිනය සහ ඉවත් කිරීමේ දිනය නොසලකා මිලදීගත් වර්ෂයට ක්ෂය නොකර ඉවත් කළ වර්ෂයට ක්ෂය කර තිබුණි. | අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ප්‍රමිත ප්‍රකාරව පිළියෙල කිරීම ආරම්භ කළ **2013** වර්ෂයට පසුව වත්කම් මිලදී ගෙන නොමැති බැවින්, ප්‍රමිත අනුව ක්ෂය කිරීම් අවශ්‍ය නොවූ බව හා අළුත් වත්කම් මිලදී ගැනීමෙන් පසුව ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිත ප්‍රකාරව ක්ෂය ප්‍රතිපත්තිය පිළියෙල කර ගත යුතුය. මෙම වරද නිවැරදි කර **2020** වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුවීම. |

**1.5.2** ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ ව්‍යාපෘතියක් වූ ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව සතුව **2019** දෙසැම්බර් **31** දිනට පැවති ශුද්ධ අගය රු.මිලියන **5.93** ක් වූ දේපල, පිරියත හා උපකරණද, රු.මිලියන **6.87** ක් වූ ජංගම වත්කම් හා රු.මිලියන **8.3** ක්වූ ජංගම වගකීම්ද අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. එසේ වුවද බැංකුවට අදාළ ආදායම් හා වියදම් මුදල් පදනම මත ගණනයකර අරමුදලට ඒකාබද්ධකර තිබුණි. | ජාතික අක්ෂි බැංකුව අරමුදලේ වෙනම අංශයක් හැටියට නොව ව්‍යාපෘතියක් වශයෙන් පවත්වා ගෙන යන බැවින් වත්කම් හා බැරකම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකළ බව, ව්‍යාපෘතිය අවසානයේ අක්ෂි රෝහල නෛතික ආයතනයක් බවට පත් වූ පසුව පවරා දෙන තෙක් ඉන්වෙන්ට්‍රි ගත කර ඇති බව, අක්ෂි බැංකුව නෛතික ආයතනයක් වූ පසුව එහි ආදායම් හා වියදම් උපචිත පදනමට ගිණුම්ගත කරන බව. | අක්ෂි බැංකුව සතු වත්කම් හා වගකීම් පිළිබඳ සියළු තොරතුරු අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. අක්ෂි බැංකුවේ ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතුය. මෙම වරද නිවැරදි කර **2020** වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුවීම. |
| (ආ) | **2019** දෙසැම්බර් **31** දිනට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය වෙතින් ලැබිය යුතු රු.මිලියන **10.58** ක් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ණයවර ලිපි වටිනාකම සම්බන්ධව අදාළ බැංකුවෙන් නිකුත් කරන තහවුරු කිරීමේ ලිපිය **(Letter of Confirmation) 2019** අවසාන ගිණුම් පිළියෙල කිරීමේ දිනය තෙක් ලැබී නොතිබුණු බව, ණයවර ලිපිය විවෘත කිරීම සඳහා ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයට ලබාදී ඇති මුදල හා බිල් වටිනාකම අතර වෙනස රු.මිලියන **10.58** ක් මේ වන විට ප්‍රතිපූර්ණය කර ඇති බව හා ඉදිරි වර්ෂයේ ගිණුම් ප්‍රකාශවලින් ඒ පිළිබඳ හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කර **2020** වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුවීම. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | අරමුදලේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | ජාතික අක්ෂි බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | | |
| (අ) | ජාතික අක්ෂි බැංකුවේ කුණික සැකසුම් ගාස්තු | 42.75 | 39.47 | 3.28 | අක්ෂි බැකුව භාරයක් ලෙස වෙනම ආයතනයක් වශයෙන් නීතිගත කරන තෙක් අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යනු ලබන හෙයින් එහි ගණුදෙනු මූල්‍ය පදනම මත ගිණුම් ගතකර ඇති බව. | අරමුදලේ මූල්‍ය ප්‍රකාශන හා ජාතික අක්ෂි බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සැසඳිය හැකි පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතුවීම. |
| (ආ) | ජාතික අක්ෂි බැංකුවේ වියදම් | 48.40 | 49.21 | 0.80 | -එම- | -එම- |
| (ඇ) | සුළු කොටස් හිමි අයිතිය-ජාතික අක්ෂි බැංකුව | 9.96 | 23.00 | 13.04 | -එම- | -එම- |

### 1.6 නීති, රීති, හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 381 | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2016 වර්ෂයේදී රාජ්‍ය බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භකර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු. මිලියන 12.11 ක් විය. | මුදල් රෙගුලාසි 381 අදාළ වන්නේ නිල බැංකු ගිණුම් සඳහා බව හා මෙම ගිණුම අරමුදලේ නිල බැංකු ගිණුමේ පවතින මුදල් කළමනාකරණය සඳහා ආරම්භ කරන ලද ගිණුමක් බව, මෙම ගිණුම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විවෘත කර ඇති බව, | මෙම ගිණුම නිල බැංකු ගිණුමෙහි කටයුතුවලට අදාළ ගිණුමක් වන බැවින් රජයේ මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ අනුමැතිය ලබා ගත යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කෙසේ වුවද මේ පිළිබඳව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | |
| (ආ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අදාළ සැලසුම් පිළියෙල කිරීමට අවධානය යොමුවී ඇති බව. | අදාළ සැලසුම් කඩිනමින් පිළියෙල කිරීමට හා ඒ අනුව ඉලක්ක හා අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 90.46 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 207.16 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 116.70 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට, සමාලෝචිත වර්ෂයේ වියදම රු.මිලියන 121.14 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පිහිටුවීමට සිංගප්පූරුවේ Asia Cornea Foundation ආයතනය සමඟ 2010 වර්ෂයේදී එළඹ තිබුණු අවබෝධතා ගිවිසුමට අනුව හා ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා 2013 අගෝස්තු 29 දින ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පනතක් මගින් වෙනම ආයතනික ව්‍යුහයක් සහිත ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීමට 2020 අගෝස්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ජාතික අක්ෂි පනත මේ වන විට කැබිනට් මණ්ඩලයට යොමු කිරීමට සූදානම් කර ඇති බව හා අමාත්‍යාංශයේ නීති අංශය මේ සම්බන්ධව කටයුතු කරමින් සිටින බව. | පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද පනතක් මගින් ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව වෙනම ආයතනික ව්‍යුහයක් සහිත නෛතික ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීම කඩිනමින් කළ යුතුවීම. |
| (ආ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපිත කරන තෙක් එහි කටයුතු ව්‍යාපෘතියක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යාමටද, 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන | මේ පිළිබඳ අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර ඇති බව | 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව, ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකිය |

| | | |
|---|---|---|
| කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා වැටුප් ගෙවීමටද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1.1 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකීමට අවශ්‍ය කොන්දේසි සම්පූර්ණ වී නොතිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කළ නොහැකිව තිබුණි. | හා ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | නොහැකි බැවින් හා ඒ අනුව කාර්ය මණ්ඩලය බඳවාගත නොහැකි බැවින් ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළ යුතු අතර ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බලා කටයුතු කළ යුතුවීම. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී ව්‍යාපෘති කාලය අවසන් වී තිබුණු ඩෙංගු ආවේක්ෂණ ව්‍යාපෘතියෙහි (Dengue Tools Project) ඉතිරි වී තිබුණු රු.මිලියන 13.43 ක් පරිත්‍යාගය කළ ආයතනය වෙත යැවීමට හෝ ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලෙහි පොදු අරමුදල වෙත පවරා ගැනීමට හෝ පියවර ගෙන නොතිබුණි. | කාලය අවසන් වී ඇති ව්‍යාපෘතියේ ඉතිරි මුදල ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | විදේශාධාර ව්‍යාපෘති නිම වූ පසු ඉතිරි මුදල් සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම ප්‍රකාරව කටයුතු කිරීමට හෝ එම මුදල් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ පොදු අරමුදල වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) | කොන්ත්‍රාත් 17 ක ඉදිකිරීම් නිමවී තිබුණද, වර්ෂ 2 ක සිට වර්ෂ 6 ක් දක්වා කාල පරාසයක සිට පැවතෙන රු.1,429,775 ක් වූ රැඳවුම් මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමක් ලෙස හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | රැඳවුම් මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීම පිළිබඳව අවධානය යොමුවී ඇති බව. | රැඳවුම් මුදල් ඉල්ලීම් නොකිරීම සම්බන්ධයෙන් අදාළ කොන්ත්‍රාත් ආයතන දැනුවත් කළ යුතු අතර ඔවුන්ගෙන් ලැබෙන ප්‍රතිචාර අනුව ආදායමක් ලෙස හඳුනා ගැනීමට හෝ සුදුසු වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) | සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉටුකර දී නොතිබුණු, මධ්‍යම රජයේ සහ පළාත් හා දිස්ත්‍රික් රෝහල්වල වෛද්‍ය උපකරණ අවශ්‍යතාවය 2018 වර්ෂයේ හා 2019 වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 9,845 ක් හා රු.මිලියන 2,131 ක් විය. මීට අමතරව මහ රෝහල් හා මූලික රෝහල් 11 ක් සඳහා අත්‍යවශ්‍ය උපකරණ 130 ක අවශ්‍යතාවයද, | මෙහි සඳහන් බොහෝ වෛද්‍ය උපකරණ ජාතික අයවැයෙන් සහ භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් සපුරා ඇති බව. | සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතා වෙනුවෙන් අරමුදල සතු පොදු අරමුදල් යොදවා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාවට නැංවිය යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | වැඩ හා කාර්යයන් 13 ක අවශ්‍යතාවයක්ද පැවතුණි. නමුත් එම අඩුපාඩු පිළිබඳ සොයා බලා ප්‍රමුඛතාවය පදනම් කරගෙන ඉන් කිසියම් හෝ ප්‍රමාණයක් පොදු අරමුදලින් ඉටු කර දීමේ ක්‍රමවේදයක් අරමුදල සතුව නොතිබුණි. | | |
| (ඇ) | අම්පාර මහ රෝහල තුළ ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 4.68 ක් වූ පවතින ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කර ගෙවන වාට්ටුවක් ස්ථාපිත කිරීමට 2011 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණද, ඉන් බැහැරව කාමර 08 කින් සමන්විත බිම්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අරමුදලින් රු.මිලියන 18.20 ක් වැය කර තිබුණි. | නැගෙනහිර පළාතේ පෞද්ගලික රෝහල් සංඛ්‍යාව අවම මට්ටමක පවතින බැවින් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය සේවා අවශ්‍යතාවයන් සඳහා මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇති බව,<br>ගෙවන වාට්ටුවක් ඉදි කළ සැනින් දෛනිකව එහි කාමර සියල්ල රෝගීන්ගෙන් පිරී ඉතිරි යාමක් අරමුදල හෝ අමාත්‍යාංශය හෝ රෝහල හෝ බලාපොරොත්තු නොවූ බව හා ගෙවන වාට්ටු ඉදි කිරීමට වැය වූ මුදල රෝගීන්ගෙන් අය කිරීමටද අපේක්ෂාවක් නොවූ බව. | අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව කටයුතු කර ඇති බැවින් ඒ සඳහා ආවරණ අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. සෞඛ්‍ය සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉදිකරන ගොඩනැගිලි ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් යෙදවූ මුදලට අගය එකතු කිරීමටත් අදාළ සම්බන්ධිත ආයතනය සමඟ එක්ව කටයුතු කළ යුතුවීම. |
| (ඉ) | කෑගල්ල දිස්ත්‍රික්කයේ මාතෘ හා ළමා සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන 04 ක් ඉදිකිරීම සඳහා අරමුදලින් රු.මිලියන 11.48 ක් වැය කර තිබුණි. එම මුදලින් රු.මිලියන 3.26 ක් වැයකර ඉදිකිරීම් නිම කර 2018 වර්ෂයේදී ජනතා අයිතියට පවරා තිබුණු වේරගොඩ සෞඛ්‍ය සායන මධ්‍යස්ථානයෙහි මාසයකට දෙවරක් ළදරු බර මැනීම් පමණක් සිදු කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වන විටත් වෙනත් කිසිදු සායනික කටයුත්තක් සඳහා භාවිතකර නොතිබුණු හෙයින් ගොඩනැගිල්ල ඌන උපයෝජිත තත්ත්වයට පත්ව තිබුණි. තවද රු.මිලියන 3.32 ක් වැයකර ඉදිකර තිබුණු වැගල්ල සෞඛ්‍ය සායන මධ්‍යස්ථානය 2016 වර්ෂයේදී ජනතා අයිතියට පවරා තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු සායනික කාර්යයක් සඳහා යොදවා | කෑගල්ල දිස්ත්‍රික්කයේ මාතෘ හා ළමා සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන පවත්වා ගැනීමේ වගකීම සබරගමුව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය හා කෑගල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙත පවතින බව, අඩුපාඩු නිවැරදි කර ක්‍රියාකාරී ආයතනයක් ලෙස පවත්වා ගෙන යන බව දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා දන්වා ඇති බව, වැගල්ල සෞඛ්‍ය මධ්‍යස්ථානයේ අඩුපාඩු සම්පූර්ණකර සායනික කටයුතු පවත්වා ගෙන යන බව හා තලාව සෞඛ්‍ය මධ්‍යස්ථානයට විදුලිය ලබාදී අඩුපාඩු සහිතව පවත්වා ගෙන යන බව. | සෞඛ්‍ය සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉදිකරන ගොඩනැගිලි ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් යෙදවූ මුදලට අගයක් ලබා ගැනීමටත් අදාළ ආයතන සමඟ එක්ව කටයුතු කළ යුතුය. ඉදිකිරීම්වල ප්‍රමිතිය පිළිබඳ පරීක්ෂාකාරී වීමටත්, නිරීක්ෂණය වන අඩුපාඩු අදාළ අවස්ථාවේදීම නිවැරදිකරවා ගැනීමටත් කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. ඊට අමතරව රු.මිලියන **2.19** ක් වැයකර ඉදිකිරීම් නිම කර **2016** වර්ෂයේදී ජනතා අයිතියට පවරා තිබුණු තලාව සෞඛ්‍ය සායන මධ්‍යස්ථානය, දොර ජනේල සඳහා ප්‍රමිතියෙන් තොර ලී යොදා තිබීම, සීලිං විදුලි පංකා ක්‍රියා නොකිරීම, වතුර මෝටරය ක්‍රියා නොකිරීම, කාර්ය මණ්ඩල වැසිකිලියේ ජලය බැස යාම නිසි පරිදි සිදු නොවීම, ජල පිරවුම් ටැංකිය ක්‍රියා විරහිත වීම වැනි අඩුපාඩු සහිතව ඉදිකර තිබුණු බවත්, අඩුපාඩු පිළිබඳව දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත දැනුම් දී තිබුණද **2019** දෙසැම්බර් **31** වන විටත් එම අඩුපාඩු සම්පූර්ණ කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය. | | |
| (ඊ) | රජයේ රෝහල් සඳහා අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීමට හා රෝහල් අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් රැස් කිරීමේ අරමුණින්, සෞඛ්‍ය සංවර්ධන ලොතරැයි ක්‍රමය **1998** සැප්තැම්බර් මාසයේදී හඳුන්වා දී තිබුණු අතර සෑම දිනුම් අදින වාරයකටම ප්‍රථමයෙන් එම වාරයේ අරමුදලින් කෙරෙන කාර්යය හඳුනාගෙන ප්‍රකාශයට පත් කර එකී කාර්යය ඉටු කළ යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. **2014** වර්ෂයේ සිට **2019** ජූනි **30** දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ලැබී තිබුණු රු.මිලියන **328.33** ක ලොතරැයි ආදායමෙන් රෝහල් සඳහා උපකරණ මිලදී ගැනීමට සහ රෝහල් අළුත්වැඩියා කටයුතු සඳහා පිළිවෙළින් රු.මිලියන **17.43** ක් හා රු.මිලියන **80.47** ක් පමණක් වැය කර තිබුණු අතර එය සමස්ථ ලොතරැයි ආදායමෙන් සියයට **29.81** ක් පමණක් විය. | අවධානය යොමුකර ඇති බව. | සෞඛ්‍ය සංවර්ධන ලොතරැයි ක්‍රමය මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතුවීම. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහරගම අපේක්ෂා රෝහලට Tomotherapy linear Accelerator යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා අරමුදල යටතේ අපේක්ෂා රෝහල නමින් ඇති බැංකු ගිණුමට මහජන ආධාර රැස් කිරීමේ අරමුණ ඇතිව සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ද, අරමුදල වෙනුවෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල් හා Fight Cancer Guarantee Trust සංවිධානය හා එක්ව දින රහිත අභිප්‍රාය ලිපියකට (Letter of Intent) අත්සන් තබා තිබුණි. කෙසේ වෙතත් Fight Cancer Guarantee Trust ආයතනය සමාජ සේවා හා පොදු පහසුකම් සැපයීම සඳහා වූ පුණ්‍ය කටයුතුවලට සම්බන්ධ ආයතනයක් ලෙස සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් විධිමත් පරිදි බලය ලබා ගත් ආයතනයක් නොවීය. අභිප්‍රාය ලිපිය අත්සන් කළ දිනය හා එහි බලාත්මක දිනය නිශ්චය කර නොතිබුණු අතර අභිප්‍රාය ලිපියේ පළමුවන කරුණ ප්‍රකාරව අදාළ පාර්ශවයන් තුන විසින් 2020 අගෝස්තු 31 දින වන විටත් අවබෝධතා ගිවිසුමකට එළඹී නොතිබුණි. එම ලිපියේ තුන්වන කරුණ ප්‍රකාරව, බැංකු ගිණුමට පරිත්‍යාගකරුවන් විසින් සෘජුවම මුදල් තැන්පත් කිරීමට යොමු කළ යුතු වුවද ඉන් බැහැරව Fight Cancer Guarantee Trust කණ්ඩායමේ මෙහෙයවීමෙන් ගෙන් ගෙට ගොස් මහජන ආධාර රැස්කර තිබුණු අතර එපරිදි රැස් කලේයැයි සඳහන් රු.255,500 ක් බැංකු ගිණුමට බැර කර තිබුණි. | වැඩ බලන සෞඛ්‍ය ලේකම්වරයා විසින් 2019 අප්‍රේල් 01 දින අභිප්‍රාය ලිපියට (Letter of Intent) අත්සන් කර ඇති බව, අරමුදල වෙනුවෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා අත්සන් කර ඇති බව, ප්‍රදේශයේ සියළුම ජනතාවට බැංකුවට සෘජුවම මුදල් තැන්පත් කළ නොහැකි හෙයින් ගිංතොට සංවර්ධන පදනම විසින් මුදල් එකතුකර සෘජුවම අමාත්‍යවරයාට භාරදී ඇති බව සහ එම මුදල සෘජුවම බැංකුවට තැන්පත් කර ඇති බව. | එකඟතාවයන් සහ ගිවිසුම්වලට එළඹීමට පෙර අදාළ බාහිර ආයතනවල නෛතික තත්ත්වය පිළිබඳ අවධානය යොමු කළ යුතුය. එකඟ වූ කරුණුවලට අනුකූලව අවබෝධතා ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. බැංකු ගිණුමට සෘජුවම මුදල් තැන්පත් කිරීමට පරිත්‍යාගකරුවන්ව යොමු කළ යුතුය. ඉන් බැහැරව සිදුවන කටයුතු සම්බන්ධයෙන් වගකීමට බැඳීමක් ඇති නොවන ආකාරයෙන් රාජ්‍ය නිලධාරීන් කටයුතු කළ යුතුවීම. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) නිශ්චිත කාර්යයන් 24ක් සඳහා ලැබී තිබුණු රු.මිලියන 36.34 ක පරිත්‍යාග වර්ෂ 2 ක සිට වර්ෂ 32 ක කාල පරාසයක් තුළ එම අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා උපයෝජනයකර නොතිබුණි. | මෙම පරිත්‍යාගයන් උපයෝජනය කර අරමුණුගත කාර්යයන් ඉටුකර ගන්නා ලෙස අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන බව. | යම් නිශ්චිත කාර්යයක් ඉටු කිරීම සඳහා අරමුදල වෙත පරිත්‍යාග ලෙස ලැබී ඇති අරමුදල් එම කාර්ය ඉටුකිරීම සඳහා යෙදවිය යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව නංවාලීම වෙනුවෙන් අරමුදල සතු පොදු අරමුදල් උපයෝජනය කරන ආකාරය පිළිබඳව වැඩ සටහන් පිළියෙල කර නොතිබුණි. 2015 වර්සයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී පොදු අරමුදලේ පැවති, රු.මිලියන 362 ක් උපයෝජනය නොකර ඉතිරිකර තිබුණි. තවද පසුගිය වර්ෂ 05 ක කාල පරිච්ඡේදය තුළදී, පනතෙහි සඳහන් අරමුණුගත කාර්යයන් සඳහා වියදම් කිරීමේ ප්‍රතිශතය, වැය කළ මුළු මුදලින් සියයට 76 ක සිට සියයට 7 ක් දක්වා ක්‍රමයෙන් අඩු වී තිබුණු අතර ඊට සාපේක්ෂව අරමුණුගත නොවන කාර්යයන් සඳහා වියදම් කිරීමේ ප්‍රතිශතය වැය කළ මුළු මුදලින් සියයට 10 ක සිට සියයට 35 ක් දක්වා වැඩි වී තිබුණි. | අදාළ වැඩ සටහන් පිළියෙල කිරීමට අවධානය යොමුවී ඇති බව, අරමුදලට ලැබෙන මුදල් අදාළ වර්ෂයේදීම උපයෝජනය නොකරන බව, ජාතික අයවැයෙන් දිවයිනේ සියළුම සෞඛ්‍ය සේවා සපයන ආයතනයන්හි සංවර්ධනය සඳහා ප්‍රතිපාදන සපයනු ලබන බැවින් ජාතික අයවැයෙන් ප්‍රතිපාදන නොකරන හදිසි අවශ්‍යතාවයන් සඳහා අරමුදලෙන් ප්‍රතිපාදන සපයන බව. | අදාළ වැඩ සටහන් කඩිනමින් පිළියෙල කිරීමට හා ඒ අනුව ඉලක්ක ගත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂක කටයුතු වෙනුවෙන් මුදල් වැය කිරීම අරමුදලේ ප්‍රධාන අරමුණ වන බැවින් එම අරමුණ ඉටුකිරීම වෙනුවෙන් හැකිතාක් දුරට අරමුදලේ මුදල් උපයෝජනය කළ යුතුය. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතා මොනවාද යන්න හඳුනා ගැනීමට හා එම අවශ්‍යතා වෙනුවෙන් මුදල් යෙදවීමට පියවර ගත යුතුවීම. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති මාර්ගෝපදේශ අනුගමනය කර ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් සපුරාගත යුතු වුවද ඊට පටහැනිව කටයුතු කරමින් කිසිදු ප්‍රසම්පාදන ක්‍රමවේදයකට අනුගත නොවී, සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 9.20 ක් වැය කර ජාතික අක්ෂි බැංකුව සඳහා Cornea Storage Media Sterile (Vial) ඒකක 480 ක් මිලදී ගැනීමටද, 2019 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදය තුළදී පෞද්ගලික රසායනාගාරයක් වෙත රු.මිලියන 2.18 ක් ගෙවා අක්ෂි පරිත්‍යාගකරුවන්ගේ රුධිර සාම්පල් පරීක්ෂා කර ගැනීමටද කටයුතු කර තිබුණි. 2019 නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා එම රසායනාගාර පරීක්ෂණ වෙනුවෙන් රසායනාගාරයක් තෝරා ගැනීම සඳහා විවෘත ලංසු කැඳවා තිබුණු නමුත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | අක්ෂි බැංකුව සඳහා Cornea Storage Media Sterile (Vial) මිලදී ගැනීමට සහ රුධිර සාම්පල් පරීක්ෂාව සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමට ජාතික අක්ෂි රෝහලේ ප්‍රසම්පාදන කමිටුව විසින් 2020 වසරේ සිට කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | සංග්‍රහයේ 2.8.5 (ආ), 5.3.1, 5.3.11, 5.3.13, 5.3.19, 6.3.3, 6.3.6, 7.9.11 හා 7.11.1 යන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණු අතර එපරිදි තෝරාගත් රසායනාගාරය වෙත එම මාස දෙක තුළදී රසායනාගාර පරීක්ෂණ සඳහා රු.862,750 ක් ගෙවා තිබුණි. | | |
| (ආ) | මහරගම අපේක්ෂා රෝහලේ Pet CT Scanner යන්ත්‍රය සඳහා Independent Fractionation and Injection Unit for high energy Radiopharmaceuticals with automated injection unit 01 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 30.08 ක් අරමුදලින් වැය කර තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව, කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 80 ක් යන්ත්‍රය රෝහලට භාර දීමෙන් පසුද, ඉතිරි සියයට 20 අදාළ පුහුණුව හා ප්‍රතිග්‍රහණ සහතිකය ලබා දීමෙන් පසුවද ගෙවිය යුතු වුවත්, ස්ථානගත පුහුණුව නිෂ්පාදන ආයතනයේ විශේෂඥවරයෙකු විසින් ලබා දුන් බව හා යන්ත්‍රය අදාළ පිරිවිතරවලට අනුකූලව සපයා ඇති බව තහවුරු කර ගැනීමෙන් තොරව රු.මිලියන 30.08 ක් වූ සම්පූර්ණ වටිනාකම 2019 දෙසැම්බර් 24 දින ගෙවා තිබුණි. | යන්ත්‍රය පිරිවිතරවලට අනුකූලව භාරදී ඇති බවටත් නිසි පරිදි ස්ථානගත පුහුණුව ලබාදී ඇති බවටත් අධ්‍යක්ෂවරයා සහතිකවී ඇති බව හා ඒ අනුව සම්පූර්ණ වටිනාකම ගෙවා ඇති බව. | කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව ප්‍රසම්පාදන කාර්යය ඉටු කරවා ගැනීමට ප්‍රසම්පාදන අස්ථිත්වය කටයුතු කළ යුතුය. තවද ස්ථානගත පුහුණුව ලබා ගැනීම හා පිරිවිතරවලට අනුව යන්ත්‍රය සපයා ඇති බවට නිශ්චිතව තහවුරුකර ගැනීමෙන් පසුව පමණක් සම්පූර්ණ මුදල ගෙවීම ප්‍රසම්පාදන අස්ථිත්වයේ වගකීමක් ලෙස සළකා කටයුතු කළ යුතුවීම. |